# ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග වගාව හා ග්‍රාමීය දරිද්‍රතාවය

(රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

RECEIVED
30 MAR 2016
Faculty of ... Studies
University of Kelaniya

## සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව

## (ආර්ථික විද්‍යාව)



| ප්‍රවේශ අංකය: | 1186 |
|---|---|
| වර්ග අංකය: | |



**ECON/R/122/98**

එච්. එම්. කේ. හේරත්

## සාරාංශය

සුළු අපනයන බෝග වගාව තුළින් ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීමට ඇති කරන බලපෑම කුමක් ද යන්න සොයා බැලීම සඳහා සිදු කළ මෙම පර්යේෂණය මගින් පොදුවේ ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග වගාවේ ආරම්භය, විකාශය හා මෑතකාලීන උපනතීන් පිළිබඳ සොයා බලන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකළ රත්නපුර දිස්ත්‍රික්කය තුළ එකී භෝග වගා කිරීම සඳහා භාවිතා කළ භූමි පරිභෝජනරටාව, වගා කළ බෝගවර්ග, ලැබූ අස්වැන්න, අලෙවි ක්‍රම, මිල, පිරිවැය, ශ්‍රම භාවිතය ආදායම, පොහොර භාවිතය, ආයතනික ව්‍යුහය වැනි කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලදී.

ග්‍රාමීය දරිද්‍රතාවය ඇතිවීමට හා වර්ධනය වීමට හේතු මෙන්ම ග්‍රාමීය දරිද්‍රතා ගැටළු අවම කිරීම සඳහා නිදහස ලැබීමෙන් පසු ගත් ක්‍රියාමාර්ග සහ එම වැඩ සටහන්වල දූර්වලතා හා ලැබූ ප්‍රගතිය කෙබඳු වේද යන්න පර්යේෂණයට බඳුන් විය.

අධ්‍යයනය මගින් හඳුනා ගනු ලැබූ ප්‍රධාන කරුණු අතර සුළු අපනයන බෝග වගාව තුළින් ප්‍රශස්ථ භූමි පරිබෝජන රටාවක් පෙන්නුම් කරන ලදී. ග්‍රාමීය අංශයේ සේවා නියුක්තිය මෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් තත්වය ඉහළ නංවන අතිරේඛ ආදායම් මාර්ගයක් බවට එය පත්වී තිබුණි. එම ප්‍රදේශවල ජනතාවගේ සමස්ථ ආදායමෙන් 9.5% ක් පමණ සුළු අපනයන බෝග වගාවෙන් ලබාගෙන තිබුණි. තේ හා පොල් වගාව යටතේ අතුරු බෝග ලෙස ද, කුරුඳු බෝගය තනි වගාවක් ලෙස ද ව්‍යාප්තවී තිබෙනු දැක ගත හැකි විය. මේ වන විට වගා බිම් ප්‍රමාණය ඉහළ යාම, අපනයන ඉපයීම් හා ජාතික නිෂ්පාදනයට කරන දායකත්වය තුළින් ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබුව ද, නිෂ්පාදන කළමනාකරණ දූර්වලතා සහ උසස් බීජ හා රෝපන ද්‍රව්‍ය සොයා ගැනීමේ අපහසුතා, විධිමත් වෙළඳපලක් නොතිබීම නිසා නිෂ්පාදනවලට සාධාරණ මිලක් නොලැබීම ගොවීන්ට ප්‍රබල ගැටළුවක් වී තිබුණි. වගාව අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු නොවීම. පසු අස්වනු තාක්ෂණික ක්‍රම ප්‍රචලිත නොවීම. අමුද්‍රව්‍ය නිමිද්‍රව්‍ය බවට පත්කරන කර්මාන්ත ප්‍රාදේශියව ස්ථාපිත නොවීම වැනි ගැටළු ගණනාවක් නිසා ලබාගත හැකි ඉහළම අස්වැන්න හා ආදායම ලබා ගැනීමේ ගැටළු ඇතිකර ඇත.

මෙම තත්වය වෙනස් කර වගාවෙන් වැඩිදියුණු කිරීම වැඩි අස්වැන්නක් ගැනීම උදෙසා නිශ්පාදනයේ ගුණාත්මක භාවය වැඩි කිරීම, උසස් තත්වයේ නව පැළෑටි හා රෝපන ද්‍රව්‍ය හඳුන්වා දීමට කටයුතු කිරීම, ප්‍රදේශයේ මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම. අගය එකතු කිරීමේ නිෂ්පාදන වටිනාකම් ඉහළ නැංවීම. පසු අස්වනු තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම වැනි යෝජනා මගින් නිෂ්පාද ප්‍රමාණ වැඩි කිරීමෙන්, නිෂ්පාදනයන්ට ලැබෙන මිල ස්ථාවර කිරීමත් මගින් එම ගොවීන්ගේ ආදායමට 15% ක පමණ ආදායමක් දක්වා වැඩි කිරීමට සැලැස්වීම මගින් ඔවුන්ගේ දරිද්‍රතා ගැටළුවට පිළියමක් ලබාගැනීමට මග පෙන්වීම. ඔවුන්ගේ පරිභෝජන මට්ටම, ආයෝජන මට්ටම මෙන්ම ඉතිරි කිරීමේ හැකියාව ඉහළ නංවාගැනීමට කටයුතු සලසාදීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ අපේක්ෂාවයි.

## Abstract

This research was conducted in order to identify the possible factors which could have an effrct on the alleviation of rural poverty through minor export crops cultivation, In this research, special attention was paid in the historical perspectives and contemporary developments of land consumption, types of crops cultivated, the harvest reaped, methods of marketing, the prices, the expense, the income, the use of labour, the market, the use of fertilizer, and the organizational structure in Rathnapura District.

This research also included what are causes of the beginning and spreading of rural poverty? what are the measures taken after the Independence of minimize poverty related issues? what are the shortcomings of such measures? and what are the progresses made? The finding of the research show proper land consumption system through the minor crop cultivation which had become a source of income of the people in the area. Their income level. The cultivation of peper and cinnamon was very famous among the farmers as it gave a high income. It was the cultivation of Situnella (Pengiri) that become popular among the farmers in Embilipitiya in these areas had earned 9.5% of there total income through minor crops cultivation. By now even if there is a progress throng the contribution made to export earnings and national productivity, the main problem that the farmers have to face is that they are unable to get a fare and favorable priece for their products due to the weak nesses in management, difficulties in finding high quality seeds and plantings materials and due to the unavailability of a satisfactory market.

A number of suggestions can be made to maximize the productivity by maintaining a fixed price for their products. This would help them to raise their income up to 15%. It is also necrsory to change the existing conditions and to raise the quality of the product in order to development the cultivation and to get more hornets. If in also necessary to introduce a variety of high quality plants and planting materials, to introduce regional buying centers, to increase the value of the value-added products and to introduce proper post harvesting techniques. This study attempts to guide them to find out a solution to their poverty issues. Through this guide, it is expected to raise their Consumption laned, investment level and their savings capacity.

Key Wards : poverty, alleviation, export crops, harvesting, productivity, Consumption.